**කහවත්ත ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 16 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 15 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළී ආදායම රු. 161,251 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර, ඉකුත් වර්ෂයට අදාල තැන්පතු පොළී රු. 172,241 ක් සමාලෝචිත වර්ෂයේ පොළී ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු පරිපාලන වියදම් රු. 151,214 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | රු. 1,778,927 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | තහවුරු සාක්ෂි කිසිවක් සභාව සතුව නොමැති බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------------ | ------------------ | ------------ | ----------------------- |
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | අදාල වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතුවේ. | 2020 වර්ෂය තුල සිදු කරන බව දන්වමි. |
| (ආ) | 2017 ජුලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | සඳහන් කර ඇති අඩුපාඩු ඉදිරියේදී සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඇ) | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ | | | |
| | (i) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛයේ 2(i) ඡේදය | ලියාපදිංචි අයිතිය නොමැතිව සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 08 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල වාහන සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| | (ii) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛයේ 02(අ) ඡේදය | සභාව සතු ගර්හිත වාහන 02 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අපහරණය සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභීන් වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමට කටයුතු කළ යුතුවේ. | අදාල පහසුකම් සැලසීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,222,608 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,077,670 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,139,152 | 4,267,074 | 4,444,728 | 1,363,703 | 3,370,450 | 3,556,133 | 3,431,231 | 1,625,484 |
| කුලී | 8,170,277 | 6,564,472 | 6,596,722 | 781,919 | 8,186,805 | 6,231,484 | 6,124,980 | 794,419 |
| බලපත්‍ර ගාස්තු | 945,500 | 571,912 | 517,132 | - | 932,450 | 1,154,617 | 1,148,867 | - |
| වෙනත් ආදායම් | 11,836,844 | 10,711,645 | 25,824,180 | 9,000,000 | 9,766,550 | 8,537,062 | 11,805,659 | 11,318,903 |
| | 25,091,773 | 22,115,103 | 37,382,762 | 11,145,622 | 22,256,255 | 19,479,296 | 22,510,737 | 13,738,806 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 1348 කට අදාලව රු. 1,135,759 ක හිඟයක් පැවතුණු අතර, ඒ තුල වර්ෂ 05 ට වැඩි කාලයක් හිඟව පවතින ඒකක 96 කට අදාල රු. 303,567 ක් පැවතුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 සැප්තැම්බර් මස රතු නිවේදන නිකුත් කර ඇති බවත්, 2020 වර්ෂයේදී අදාල දේපල තහනමට ගැනීමේ කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බවත් දන්වමි. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බලපත්‍ර ලබාගත යුතු ආයතන 74 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු. 296,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත නියමිත ක්‍රියාපටිපාටියට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඇති බවත්, දැනට බලපත්‍ර ලබා නොගෙන ඇති කර්මාන්ත හඳුනාගෙන බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතින බවත් දන්වමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 මුල් අර්ධ වර්ෂය සඳහා ලැබිය යුතු වූ මුද්දර ගාස්තු රු. 2,440,810 ක් විය. අවසන් අර්ධ වර්ෂය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු 2020 පෙබරවාරි වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උප ලේඛන ලැබුණු පසු අදාල හඳුනාගැනීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ප්‍රතිපාදන ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 102,615,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දරන ලද ප්‍රාග්ධන වියදම රු. 39,578,129 ක් පමණක් විය. | අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා මුදල් රැස්කර ගැනීමට සභාව කටයුතු කළ යුතුවේ. | අපේක්ෂිත පරිදි මූලධන අධාර නොලැබීම හේතුවෙන් වෙන් කර ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනයට ගැනීමට නොහැකි වූ බව දන්වමි. |

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, වර්තමානයේ කසළ බැහැර කරනු ලබන භූමිය සභාවට පවරා ගැනීමටද අපොහොසත් වී තිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය ලිපි යොමු කර ඇති බවත්, ඒ සඳහා පිළිතුරු ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වමි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවතින අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට හෝ නියමානුකූල කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම, ඒවා ඉවත් කිරීම හෝ නියමානුකූල කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | දැනට හඳුනාගත් ඇන්දාන ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 04 ක් ඉවත් කර ඇති බව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු. 98,594,794 ක් වූ ජංගම නොවන වත්කම් වලට අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | සභාව සතු ජංගම නොවන වත්කම් වලට අදාල ලේඛන යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි. |

### 3.3.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ අනතුරට ලක්ව අළුත්වැඩියා කිරීම සඳහා රු. 73,175 ක් අත්තිකාරම් ගෙවා 2017 වර්ෂයේ ගරාජයක් වෙත | වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුවේ. | අදාල ට්‍රැක්ටරය හැකි ඉක්මනින් අළුත්වැඩියා කරදෙන බවට ගරාජයෙන් දැනුම් දී ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | හාරදී තිබුණු ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අළුත්වැඩියා කර නොතිබුණි. | | |
| (ආ) | අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින වසර 03 ක් ධාවනයේ යොදවා නොතිබූ ට්‍රැක්ටරයක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අළුත්වැඩියා කර නොතිබුණි. | වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුවේ. | අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

**3.3.3 නිෂ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අපද්‍රව්‍ය බැහැරකිරීමට ස්ථානයක් නොමැති වීම හේතුවෙන් සභාව සතු ගලි බවුසරය 2014 නොවැම්බර් සිට සභා පරිශ්‍රය තුල නිෂ්කාර්යයව පැවතුණි. | අදාල සේවා සපයන වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ගලි බවුසරයට අදාල ට්‍රැක්ටරය කසළ එකතු කිරීම සඳහා වෙනත් ටේලරයක් සමඟ යොදා ගන්නා බව දන්වමි. |

**3.4 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් රු. 2,476,558 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර ඇති බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු අය කිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවද, 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණි. | වසර 05 කට වරක් දේපල තක්සේරු කළ යුතුවේ. | 2021 වසර සඳහා වරිපනම් ප්‍රතිශෝධනය මේ වනවිට සිදුකරමින් පවතින බව දන්වමි. |